# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2487/15 – 2026 මැයි මස 05 වැනි අඟහරුවාදා – 2026.05.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2024/29.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ඒ. කේ. චන්ද්‍රලතා මිය, සෙන්ට් ජූඩ්වත්ත, ජය මාවත, ඇල්පිටිය.
2. ඒ. එල්. සරත් මයා, පහළ ගෙදර වත්ත, අම්බන, කහදූව.
3. කේ. අයි. ගයාන් රන්ජන මයා, අළුත් ගෙදර වත්ත, පැලැන්දගොඩ, ඇල්පිටිය.
4. ඒ. ජී. ප්‍රගීත් මයා, 157/ඒ, උඩලමත්ත, ගාල්ල.
5. ඩබ්. ආර්. රෝහිණී චන්ද්‍රලතා මිය, 1008/9, පැරකුම්බා පෙදෙස, මාලඹේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, 354/2, 4 වන මහල, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමග, 34/64, ඒ.බී. හේරත් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2026 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2024/29.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ඒ.කේ.චන්ද්‍රලතා මිය, සෙන්ට් ජූඩ්වත්ත, ජය මාවත, ඇල්පිටිය.
2. ඒ.එල්.සරත් මයා, පහළ ගෙදර වත්ත, අම්බන, කහදූව.
3. කේ.අයි.ගයාන් රන්ජන මයා, අළුත් ගෙදර වත්ත, පැලැන්දගොඩ, ඇල්පිටිය.
4. ඒ.ජී. ප්‍රගීත් මයා, 157/ඒ, උඩලමත්ත, ගාල්ල.
5. ඩබ්.ආර්. රෝහිණී චන්ද්‍රලතා මිය, 1008/9, පැරකුම්බා පෙදෙස, මාලබේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, 354/2, 4 වන මහල, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

“ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙහි උපදේශන තනතුරුවල සේවයෙහි නිරත පහත නම් සඳහන් සේවකයින්හට උපදේශක තනතුරු ශ්‍රේණිගත කිරීමේ දී යම් අසාධාරණයක් සිදුව තිබේ ද, එසේ සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.”

1. ඒ. කේ. චන්ද්‍රලතා මිය
2. ඒ. එල්. සරත් මයා
3. කේ. අයි. ගයාන් රන්ජන මයා
4. ඒ. ජී. ප්‍රගීත් මයා
5. ඩබ්. ආර්. රෝහිණී චන්ද්‍රලතා මිය

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 05 – 0011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.